ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1979 අංක 46 දරන

# ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූලි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.55 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1979 අංක 46 දරන ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 11 වන දින]

එල්.ඩී.—ඕ. 25/78

**ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරියක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ අධිකාරියේ බලතල හා කර්තව්‍ය නිශ්චිතව සඳහන් කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 1979 අංක 46 දරන ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන, මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන, යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය පිහිටුවීම හා එහි සංයුතිය

*ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය පිහිටුවීම.*

2. (1) මේ පනතෙහි "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා ගුවන් තොටුපොළවල් පිළිබඳ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබේ.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් ඊට පැවරුණු නමින් සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය. තවද ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

(3) අධිකාරියේ මුද්‍රාව යෙදීම, අධිකාරියේ ලේකම්වරයාගේ හෝ තත්කාර්ය සඳහා ක්‍රියා කිරීමට, සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් අධිකාරිය විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකුගේ අත්සනින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව යටතේ නිසි ලෙස ලියා අත්සන් කරනු ලැබූ ලේඛනයක් යයි කියනු ලබන යම් ලේඛනයක් යම් අධිකරණයක දී, විනිශ්චයාධිකාරයක දී හෝ වෙනත් ආයතනයක දී සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ ලේඛනය එසේ නිසි ලෙස ලියා අත්සන් කරන ලදැයි සලකනු ලැබිය යුතු ය.

*අධිකාරියේ සංයුතිය.*

3. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනකුගෙන් අධිකාරිය සමන්විත විය යුතු ය.

(2) අධිකාරියේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු, අමාත්‍යවරයා විසින් අධිකාරියේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(3) ගුවන් ප්‍රවාහනය, වෙනත් ප්‍රවාහන ක්‍රම, කර්මාන්ත, වාණිජ හෝ මූල්‍ය කාරණා, පරිපාලනය, කම්කරුවන් සංවිධානය කිරීම හෝ ගුවන් මගීන්ගේ අයිතිවාසිකම් නියෝජනය කිරීම පිළිබඳව ප්‍රළුල්

2—ඒ 41904—12,600 (79/05)

පළපුරුද්දක් ලබා ඇති බවට සහ ඒ විෂයයන්හි ලා ශක්‍යතාවක් දක්වා ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් අධිකාරියේ සාමාජිකයන් පත් කරනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කිරීමට පෙර, අධිකාරියේ සාමාජිකයකු වශයෙන් තම කර්තව්‍ය තමා විසින් ඉටු කිරීමේ දී හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඒ තැනැත්තාට නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත්විය යුතු ය. තවද අධිකාරියේ කිසිම සාමාජිකයකුට එවැනි කිසිම සම්බන්ධතාවක් නොමැති බවට අමාත්‍යවරයා කලින් කල සෑහීමට පත් විය යුතු ය. මේ උපවගන්තිය යටතේ තම කාර්ය තමා විසින් ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන යම් තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිනු ලබන කවර හෝ විටක අධිකාරියේ සාමාජිකයකු වන යම් තැනැත්තකු හෝ අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කිරීමට අමාත්‍යවරයා යෝජනා කරන යම් තැනැත්තකු විසින් ඒ තොරතුරු අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය යුතු ය.

(5) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එලෙස කටයුතු කරගෙන යාමට සුදුස්සකු නොවිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

4. සෑම සාමාජිකයකු ම, ඔහු කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කරතහොත් නැතහොත් ධුරය තවදුරටත් දැරීමට නුසුදුස්සකු කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය :

එසේ වුව ද, සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ සාමාජිකයකු, ඔහු කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කරතහොත් නැතහොත් ධුරය තවදුරටත් දැරීමට නුසුදුස්සකු කරනු ලැබුවහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සාමාජිකයන් ඉල්ලා අස් වීම, ධුරයෙන් ඉවත් කිරීම හා නැවත පත් කිරීම.

5. (1) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා යම් සාමාජිකයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ යම් සාමාජිකයකු—

(අ) අධිකාරියේ අවසරය නොමැතිව අනුක්‍රමික මාස පහකට වැඩි කාලයක් සඳහා අධිකාරියේ රැස්වීම්වලට පැමිණ නොමැති, හෝ

(ආ) වස්තු භංගත්වයට පත්ව ඇති හෝ තම ණය හිමියන් සමඟ යම් වැඩපිළිවෙළක් ඇති කරගෙන තිබෙන, හෝ

(ඈ) කායික හෝ මානසික අසනීපයක් නිසා අශක්‍යතාවකට පත්ව ඇති, හෝ

(ඇ) සාමාජිකයකුගේ කර්තව්‍ය ඉටු කිරීමට අන්‍යාකාරයකින් නොහැකි හෝ නුසුදුසුව ඇති

බවට අමාත්‍යවරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඒ සාමාජිකයාගේ ධුරය හිස් වී ඇති බව ඔහු විසින් ප්‍රකාශ කොට, ඒ සාමාජිකයා වෙනුවෙන් වෙනත් සාමාජිකයකු පත් කිරීමට පියවර ගනු ලැබිය හැකි ය.

(4) සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවස්ථාවෝචිත යයි අමාත්‍යවරයා කල්පනා කරන්නේ නම් කිසියම් හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(5) අධිකාරියේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් හෝ නුසුදුස්සකු බවට පත් වුවහොත් හෝ මිස ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

6. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයට හා අනුප්‍රමාණ අනුව, අධිකාරියේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

## II වන කොටස

### අධිකාරියේ කටයුතු

7. රැස්වීම්වල කාර්ය පටිපාටිය විධිමත් කිරීම සහ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සඳහා මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති අධිකාරිය විසින් සාදනු ලැබිය හැකි ය. කාර්ය පටිපාටිය විධිමත් කිරීම සහ කටයුතු කරගෙන යාම සඳහා රීති.

8. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම අධිකාරියේ කටයුතුවල වලංගු භාවය කෙරෙහි බලනොපෑ යුතු ය. කටයුතුවල වලංගු භාවය.

9. අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය. ගණපූරණය.

10. (1) අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින අධිකාරියේ සෑම රැස්වීමක ම මූලාසනය ඔහු විසින් දැරිය යුතු ය. අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටිනා සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු ඒ රැස්වීමෙහි මූලාසනය දැරිය යුතු ය. අධිකාරියේ රැස්වීම්.

(2) අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

අධිකාරිය විසින් ඇති කර ගැනීමට යෝජනා කරනු ලබන ගිවිසුමක් පිළිබඳ සම්බන්ධතාව සාමාජිකයන් විසින් එළිදරව් කළ යුතු බව.

**11.** අධිකාරිය විසින් ඇති කර ගන්නා ලද හෝ ඇති කර ගැනීමට යෝජනා කරනු ලබන ගිවිසුමක් පිළිබඳව කෙළින්ම හෝ අන් අයුරකින් යම් සම්බන්ධතාවක් ඇති සාමාජිකයකු විසින්, අධිකාරියේ රැස්වීමක දී තම සම්බන්ධතාවේ ස්වභාවය එළිදරව් කළ යුතු ය. ඒ ගිවිසුම සම්බන්ධයෙන් අධිකාරිය විසින් කරනු ලබන යම් සාකච්ඡාවලට හෝ අධිකාරිය විසින් ගනු ලබන යම් තීරණයකට හෝ ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය. ඒ කාරණය රැස්වීමේ දී සාකච්ඡා කරනු ලබන හෝ ඒ සම්බන්ධයෙන් තීරණයක් ගනු ලබන විටක ඒ සාමාජිකයා ඒ රැස්වීමෙන් ඉවත්ව යා යුතු ය.

## III වන කොටස

### අධිකාරියේ කාර්ය, කර්තව්‍ය හා බලතල

අධිකාරිය අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත් බව.

**12.** (1) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමේ දී අධිකාරිය අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත් විය යුතු ය.

(2) ජාතික යහපත කෙරෙහි බලපාන්නේ යයි අමාත්‍යවරයාට පෙනී යන කාරණාවලට අදාළව අධිකාරිය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අධිකාරියට සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි ය.

(3) යුද්ධයක් ඇත්ත වශයෙන් ම පවතින අවස්ථාවක දි හෝ යුද්ධයක් අත්‍යාසන්න අවස්ථාවක දී නැතහොත් ජාතික හදිසි අවස්ථාවක දී අධිකාරියේ හෝ අධිකාරියේ පාලනය යටතේ පවත්නා සියලු දේපළ හෝ යම් දේපළක් නැතහොත් සියලු අයිතිවාසිකම් හෝ යම් අයිතිවාසිකමක් අමාත්‍යවරයා විසින් සුදුස්සක් කිරීම සඳහා තම ක්‍රියාකාරිත්වය යටතට පත් කළ යුතු යයි අමාත්‍යවරයා විසින් නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි ය. තව ද, ඒ නියමය බලපවත්නා අතරතුර සුදුසු යයි තමා කල්පනා කරන යම් විධාන අමාත්‍යවරයා විසින් අධිකාරියට දිය හැකි අතර, ඒ විධාන අනුව ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

(4) (අ) ජාතික ආරක්ෂාව සඳහා ; හෝ

(ආ) වෙනත් යම් රටක් හෝ දේශයක් සමග පවතින ශ්‍රී ලංකා රජයේ සම්බන්ධතා කෙරෙහි බලපාන්නේ යයි අමාත්‍යවරයාට පෙනී යන යම් කාරණයක් සම්බන්ධයෙන් ; හෝ

(ඇ) ජනරජය ජාත්‍යන්තර සංවිධානයක සාමාජිකයකු වීමේ හෝ ජාත්‍යන්තර ගිවිසුමකට පාර්ශ්වකරුවකු වීමේ හේතුවෙන් ජනරජය කෙරෙහි අනුගම්‍ය වන බැඳීමක් නිදහස් කිරීම පිණිස හෝ නිදහස් කිරීම පහසු කිරීම පිණිස ; හෝ

(ඈ) වෙනත් යම් අරමුණක් මුදුන් පත් කර ගැනීම හෝ මුදුන් පත් කර ගැනීම පහසු කිරීම, ජනරජය ජාත්‍යන්තර සංවිධානයක සාමාජිකයකු වීම හෝ ජාත්‍යන්තර ගිවිසුමක පාර්ශ්වකරුවකු වීම නිසා අමාත්‍යවරයාගේ මතය අනුව උචිත වන්නේ ද ඒ අරමුණ මුදුන් පත් කර ගැනීම පිණිස හෝ මුදුන් පත් කර ගැනීම පහසු කිරීම පිණිස ; හෝ

(ඉ) ජාත්‍යන්තර සංවිධානයක සාමාජිකයකු හෝ ජාත්‍යන්තර ගිවිසුමක පාර්ශ්වකරුවකු වීමට ජනරජයට හැකි කිරීම පිණිස ; හෝ

(ඊ) සිවිල් ගුවන් සේවාවල කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ගුවන් යානාවලට ආරෝපණය කරනු ලැබිය හැකි ශබ්දයක්, කම්පනයක්, අපවිත්‍රතාවක් හෝ වෙනත් බාධකයක් වැළැක්වීම පිණිස හෝ ඒ පිළිබඳව ක්‍රියා කිරීම පිණිස

විධාන කිරීම උචිත යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, අධිකාරියට කිරීමට බලය ඇති යම්කිසි දෙයක් කරන ලෙස හෝ යම්කිසි දෙයක් කිරීමෙන් වැළකී සිටින ලෙස අමාත්‍යවරයා විසින් අධිකාරියට විධාන කළ හැකි ය.

(5) මේ වගන්තිය ප්‍රකාර දෙන ලද විධාන මේ පනතේ යම් විධිවිධානයක නියමයන්ට ප්‍රතිවිරුද්ධ වන අවස්ථාවක, ඒ නියම නොසලකා හරිනු ලැබිය යුතු අතර ඒ විධාන පිළිපැද එහි නියම ප්‍රකාර ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

අධිකාරියේ වැඩ හා කටයුතු පිළිබඳ අධීක්ෂණය, පාලනය හා පරිපාලනය අධිකාරිය සතුව ඇති බව.

**13.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ වැඩ හා කටයුතු පිළිබඳ අධීක්ෂණය, පාලනය හා පරිපාලනය අධිකාරිය සතු විය යුතු ය.

(2) අධිකාරියේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් කිසිවක්, අධිකාරිය විසින්, එහි යම් සාමාජිකයකු හෝ යම් සේවා නියුක්තයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු වෙත පවරනු ලැබූ බලතල, කර්තව්‍ය හෝ කාර්ය අධිකාරියේ විධානයට හා පාලනයට යටත්ව, ඒ සෑම තැනැත්තකු විසින් ම ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

අධිකාරියේ කාර්ය.

**14.** (1) ස්වකීය ගුවන් තොටුපොළවල් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා සම්පූර්ණ වගකීම භාර ගැනීම සහ ඒ ගුවන් තොටුපොළවල් ආරක්ෂා සහිතව සහ කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යාම සඳහා ස්වකීය මතය අනුව වුවමනා වන්නා වූ, අවශ්‍ය වන්නා වූ හෝ යෝග්‍ය වන්නා වූ සියලු සේවා සහ පහසුකම් සැලසීම අධිකාරියේ කාර්ය විය යුතු ය.

(2) යම් ගුවන් තොටුපොළක ගුවන් තරණ සේවා සලසන ලෙස අමාත්‍යවරයා විසින් ලිඛිතව විධාන කරනු ලබන අවස්ථාවක එසේ කිරීම අධිකාරියේ කාර්ය විය යුතු ය.

අධිකාරිය විසින් ඇති කර ගැනීමට යෝජනා කරනු ලබන ගිවිසුමක් පිළිබඳ සම්බන්ධතාව සාමාජිකයන් විසින් එළිදරව් කළ යුතු බව.

**11.** අධිකාරිය විසින් ඇති කර ගන්නා ලද හෝ ඇති කර ගැනීමට යෝජනා කරනු ලබන ගිවිසුමක් පිළිබඳව කෙළින්ම හෝ අන් අයුරකින් යම් සම්බන්ධතාවක් ඇති සාමාජිකයකු විසින්, අධිකාරියේ රැස්වීමක දී තම සම්බන්ධතාවේ ස්වභාවය එළිදරව් කළ යුතු ය. ඒ ගිවිසුම සම්බන්ධයෙන් අධිකාරිය විසින් කරනු ලබන යම් සාකච්ඡාවලට හෝ අධිකාරිය විසින් ගනු ලබන යම් තීරණයකට හෝ ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය. ඒ කාරණය රැස්වීමේ දී සාකච්ඡා කරනු ලබන හෝ ඒ සම්බන්ධයෙන් තීරණයක් ගනු ලබන විටක ඒ සාමාජිකයා ඒ රැස්වීමෙන් ඉවත්ව යා යුතු ය.

## III වන කොටස

## අධිකාරියේ කාර්ය, කර්තව්‍ය හා බලතල

අධිකාරිය අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත් බව.

**12.** (1) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමේ දී අධිකාරිය අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත් විය යුතු ය.

(2) ජාතික යහපත කෙරෙහි බලපාන්නේ යයි අමාත්‍යවරයාට පෙනී යන කාරණාවලට අදාළව අධිකාරිය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අධිකාරියට සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි ය.

(3) යුද්ධයක් ඇත්ත වශයෙන් ම පවතින අවස්ථාවක දී හෝ යුද්ධයක් අත්‍යාසන්න අවස්ථාවක දී නැතහොත් ජාතික හදිසි අවස්ථාවක දී අධිකාරියේ හෝ අධිකාරියේ පාලනය යටතේ පවත්නා සියලු දේපළ හෝ යම් දේපළක් නැතහොත් සියලු අයිතිවාසිකම් හෝ යම් අයිතිවාසිකමක් අමාත්‍යවරයා විසින් සුදුස්සක් කිරීම සඳහා තම ක්‍රියාකාරිත්වය යටතට පත් කළ යුතු යයි අමාත්‍යවරයා විසින් නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි ය. තව ද, ඒ නියමය බලපවත්නා අතරතුර සුදුසු යයි තමා කල්පනා කරන යම් විධාන අමාත්‍යවරයා විසින් අධිකාරියට දිය හැකි අතර, ඒ විධාන අනුව ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

(4) (අ) ජාතික ආරක්ෂාව සඳහා ; හෝ

(ආ) වෙනත් යම් රටක් හෝ දේශයක් සමග පවතින ශ්‍රී ලංකා රජයේ සම්බන්ධතා කෙරෙහි බලපාන්නේ යයි අමාත්‍යවරයාට පෙනී යන යම් කාරණයක් සම්බන්ධයෙන් ; හෝ

(ඇ) ජනරජය ජාත්‍යන්තර සංවිධානයක සාමාජිකයකු වීමේ හෝ ජාත්‍යන්තර ගිවිසුමකට පාර්ශ්වකරුවකු වීමේ හේතුවෙන් ජනරජය කෙරෙහි අනුගම්‍ය වන බැඳීමක් නිදහස් කිරීම පිණිස හෝ නිදහස් කිරීම පහසු කිරීම පිණිස ; හෝ

(ඇ) වෙනත් යම් අරමුණක් මුදුන් පත් කර ගැනීම හෝ මුදුන් පත් කර ගැනීම පහසු කිරීම, ජනරජය ජාත්‍යන්තර සංවිධානයක සාමාජිකයකු වීම හෝ ජාත්‍යන්තර ගිවිසුමක පාර්ශ්වකරුවකු වීම නිසා අමාත්‍යවරයාගේ මතය අනුව උචිත වන්නේ ද ඒ අරමුණ මුදුන් පත් කර ගැනීම පිණිස හෝ මුදුන්පත් කර ගැනීම පහසු කිරීම පිණිස ; හෝ

(ඉ) ජාත්‍යන්තර සංවිධානයක සාමාජිකයකු හෝ ජාත්‍යන්තර ගිවිසුමක පාර්ශ්වකරුවකු වීමට ජනරජයට හැකි කිරීම පිණිස ; හෝ

(ඊ) සිවිල් ගුවන් සේවාවල කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ගුවන් යානාවලට ආරෝපණය කරනු ලැබිය හැකි ශබ්දයක්, කම්පනයක්, අපවිත්‍රතාවක් හෝ වෙනත් බාධකයක් වැළැක්වීම පිණිස හෝ ඒ පිළිබඳව ක්‍රියා කිරීම පිණිස

විධාන කිරීම උචිත යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, අධිකාරියට කිරීමට බලය ඇති යම්කිසි දෙයක් කරන ලෙස හෝ යම්කිසි දෙයක් කිරීමෙන් වැළකී සිටින ලෙස අමාත්‍යවරයා විසින් අධිකාරියට විධාන කළ හැකි ය.

(5) මේ වගන්තිය ප්‍රකාර දෙන ලද විධාන මේ පනතේ යම් විධිවිධානයක නියමයන්ට ප්‍රතිවිරුද්ධ වන අවස්ථාවක, ඒ නියම නොසලකා හරිනු ලැබිය යුතු අතර ඒ විධාන පිළිපැද එහි නියම ප්‍රකාර ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

අධිකාරියේ වැඩ හා කටයුතු පිළිබඳ අධීක්ෂණය, පාලනය හා පරිපාලනය අධිකාරිය සතුව ඇති බව.

13. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ වැඩ හා කටයුතු පිළිබඳ අධීක්ෂණය, පාලනය හා පරිපාලනය අධිකාරිය සතු විය යුතු ය.

(2) අධිකාරියේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් කිසිවක්, අධිකාරිය විසින්, එහි යම් සාමාජිකයකු හෝ යම් සේවා නියුක්තයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු වෙත පවරනු ලැබූ බලතල, කර්තව්‍ය හෝ කාර්ය අධිකාරියේ විධානයට හා පාලනයට යටත්ව, ඒ සෑම තැනැත්තකු විසින් ම ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

අධිකාරියේ කාර්ය.

14. (1) ස්වකීය ගුවන් තොටුපොළවල් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා සම්පූර්ණ වගකීම භාර ගැනීම සහ ඒ ගුවන් තොටුපොළවල් ආරක්ෂා සහිතව සහ කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යාම සඳහා ස්වකීය මතය අනුව වුවමනා වන්නා වූ, අවශ්‍ය වන්නා වූ හෝ යෝග්‍ය වන්නා වූ සියලු සේවා සහ පහසුකම් සැලසීම අධිකාරියේ කාර්ය විය යුතු ය.

(2) යම් ගුවන් තොටුපොළක ගුවන් තරණ සේවා සලසන ලෙස අමාත්‍යවරයා විසින් ලිඛිතව විධාන කරනු ලබන අවස්ථාවක එසේ කිරීම අධිකාරියේ කාර්ය විය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන බලාත්මක කිරීමෙහි ලා අධිකාරිය විසින්, ගුවන් ප්‍රවාහනය සංවර්ධනය කිරීම හා එහි කාර්යක්ෂමතාව, පිරිමැස්ම හා මෙහෙයුම් ආරක්ෂාව කෙරෙහි සැලකිලි මත් විය යුතු අතර, අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධානවලට අනුකූලවම සහ ඔහුගේ පාලනය යටතේ ක්‍රියා කළ යුතුය.

ගගන යාත්‍රාංගන පිහිටුවන ලෙස අමාත්‍යවරයා විසින් අධිකාරියට විධාන කළ හැකි බව.

15. අමාත්‍යවරයා විසින් අධිකාරිය වෙත ලිඛිතව විධානයක් කිරීමෙන් ඒ විධානයෙහි සඳහන් කරනු ලබන ශ්‍රී ලංකාවේ යම් කොටසක යම් ගගන යාත්‍රාංගනයක් පිහිටුවන ලෙස, අත්කර ගන්නා ලෙස හෝ එහි කළමනාකාරිත්වය භාරගන්නා ලෙස ඕනෑම අවස්ථාවක දී අධිකාරියට විධාන කළ හැකි අතර, එවැනි යම් විධාන යක් අනුව ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

ගගන යාත්‍රාංගන පාවිච්චි කිරීම අධිකාරිය විසින් නතර නොකළ යුතු බව.

16. අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ ලිඛිත කැමැත්ත නොමැතිව, යම් ගගන යාත්‍රාංගනයක් පාවිච්චි කිරීම නතර නොකළ යුතු ය; නැතහොත් යම් ගගන යාත්‍රාංගනයක් ස්වකීය කළමනාකාරිත්වයෙන් ඉවත් නොකළ යුතු ය.

ගගන යාත්‍රාංගන තාවකාලිකව වසා දැමීම.

17. අමාත්‍යවරයාගේ හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයාගේ ලිඛිත කැමැත්ත ඇතිව මිස, අධිකාරිය විසින්, යම් ගගන යාත්‍රාංගනයක් ගුවන් ගමන් සඳහා තාවකාලිකව වසා දමනු නොලැබිය යුතු ය.

අදහස් විමසීම සඳහා අධිකාරිය විසින් විධිවිධාන සැලැස්විය යුතු බව.

18. යම් ගගන යාත්‍රාංගනයක් කළමනාකරණය කිරීමේ දී හා පරිපාලනය කිරීමේ දී හානි ඇති විය හැක්කේ යම් තැනැත්තන්ගේ සම්බන්ධතාවලට ද ඒ තැනැත්තන්ගේ අදහස් විමසීම සඳහා අධිකාරිය විසින් විධිවිධාන සැලැස්විය යුතු අතර, එසේ කිරීමේ දී අමාත්‍යවරයා විසින් අධිකාරියට දෙනු ලබන යම් විධාන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

අධිකාරියේ කර්තව්‍ය.

19. (1) 14 වන වගන්තියේ විධිවිධානවලට හානියක් නොමැතිව, අධිකාරිය විසින්—

(අ) ගුවන් තොටුපොළවල් වැඩි දියුණු කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම ද ගුවන් යානා පැහැර ගෙන යාම වැළැක්වීම සඳහා සහ වෙනත් සාහසික ක්‍රියාවලට විරුද්ධව ප්‍රමාණවත් පියවර ගැනීම ද;

(ආ) අවශ්‍ය වන්නා වූ ධාවන පථ, ධාවන මං, ඒප්‍රන, පර්යන්ත හා අනුයාත ගොඩනැගිලි සහ ගුවන් යානා නවතන ගොඩනැගිලි සැලසුම් කිරීම, වැඩි දියුණු කිරීම, ඉදි කිරීම සහ ඒවා පවත්වා ගෙන යාම ද;

(ඇ) බඩු ශීතකරණය හා බඩු සම්බන්ධයෙන් විශේෂයෙන් ක්‍රියා කිරීම ද ඇතුළුව බඩු ගබඩා කිරීම සහ බඩු සකස් කිරීම සඳහා ගුවන් තොටුපොළවල ගුදම් පිහිටුවීම ද;

(ඈ) ආණ්ඩුව විසින් තහනමට ගන්නා ලද, රාජ්‍ය සන්තක කරන ලද නැතහොත් අන්‍යාකාරයකින් රඳවා ගන්නා ලද සෑම විස්තරයකට ම අයත් බඩු සහ වෙළෙඳ බඩු රේගු බන්ධනය කිරීම සහ ගබඩා කිරීමේ කාර්යය සඳහා ගුදම් පිහිටුවීම ද;

(ඉ) මගීන්ගේ ගමන් මලු සහ බඩු බාහිරාදිය සෝදිසි කිරීම සඳහා පහසුකම් සැලසීම ද;

(ඊ) මගීන්ගේ සහ ගුවන් තොටුපොළෙහි වෙනත් තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා තැපැල්, මුදල් මාරුකිරීම, රක්ෂණය, දුරකථන සහ වෙනත් පණිවුඩ හුවමාරු කිරීමේ පහසුකම් සඳහා විධිවිධාන සැලසීම ද;

(උ) ගුවන් තොටුපොළවල ආපන ශාලා, මත්පැන් හල් සහ අතුරු පස හල් පිහිටුවා පවත්වා ගෙන යාම ද;

(ඌ) ගුවන් තොටුපොළවල විවේකාගාර, වැසිකිළි සහ වෙනත් පහසුකම් පවත්වා ගෙන යාම ද;

(එ) ගුවන් තොටුපොළවල් ආයතනයෙහි හෝටල් පිහිටුවා පවත්වා ගෙන යාම ද;

(ඒ) නිර්ව්‍යාජ මගීන්ගේ සහ ආගන්තුකයන්ගේ ප්‍රයෝජනය සඳහා ගුවන් තොටුපොළවල නැතහොත් ඒවා ආසන්න යෙහි සිනමාශාලා පිහිටුවා පවත්වා ගෙන යාම ද;

(ඔ) මගීන්ගේ ගමන්මලු සහ බඩුබාහිරාදිය භාර ගැනීම, ඒවා එහා මෙහා ගෙන යාම, ගබඩා කිරීම හෝ යානයෙන් යාන යට මාරු කිරීම සඳහා පහසුකම් සැලසීම ද;

(ඕ) සෑම විස්තරයකටම අයත් ගුවන් බඩු භාර ගැනීම, ඒවා එහා මෙහා ගෙනයාම, සහ යානයෙන් යානයට මාරු කිරීම සඳහා පහසුකම් සැලසීම ද;

(ක) මගීන්ගේ ගමන්මලුවල සහ ගුවන් බඩුවල ආරක්ෂාව සඳහා ආරක්ෂක විධිවිධාන සැලසීම ද;

(ග) තැනැත්තන්, සතුන් සහ පැලෑටි නිරෝධනය කිරීම සඳහා පහසුකම් සැලසීම ද;

(ච) මල්කරුවන්, පළතුරු වෙළෙන්දන්, රසායනඥයන්, මගීන් ගේ අවශ්‍යතා සලසන්නන්, කොණ්ඩා සැකසුම්කරුවන්, බර කුලී සහ තබා යන ගමන් බඩු ශාලා ද ඇතුළුව මගීන් ගේ පහසුකම් සඳහා ගුවන් තොටුපොළවල වැඩපිළිවෙලවල් යෙදීම ද;

(ජ) සම්පූර්ණ බැංකු පහසුකම් සැලසීම ද;

(ට) ආණ්ඩුවේ සන්ධාන කර්තව්‍ය කෙරෙහි නිසි සැලකිල්ල ඇතිව වාහන ධාවනය සහ මගීන්ගේ සහ අමුත්තන් ගුවන් තොටුපොළට ඇතුළුවීම සහ ඉන් පිටව යාම විධිමත් කිරීම සහ පාලනය කිරීම ද;

(ඩ) විශේෂ අමුත්තන් පිළිගැනීම සහ ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පහසුකම් සැලසීම ද;

(ණ) ගුවන් තොටුපොළට හෝ ගුවන් තොටුපොළෙහි සිට ගමන් කරන මගීන් සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම ද;

(ත) මගීන්, ගුවන් තොටුපොළට පැමිණෙන අමුත්තන්, ගමන් මලු සහ ගුවන් බඩු සඳහා විශේෂ ස්ථාන සලසා පවත්වා ගෙන යාම ද;

(ද) පැමිණෙන සහ පිටත්ව යන මගීන් සඳහා නිරු බදුවලින් නිද හස් ස්ථාන පිහිටුවා කළමනාකරණය කිරීම ද, විකුණුම් පොළවල් පිහිටුවීම සඳහා සහ වෙළෙඳ බඩු ගබඩාකර තැබීම සඳහා කාමර සහ ස්ථාන කුලියට දීම ද;

(න) හෙලිකොප්ටර් තොටුපොළවල් පිහිටුවා කළමනාකරණය කිරීම ද;

(ප) රේගු, ආගමන, සෞඛ්‍ය සහ ආරක්ෂක පිරික්සුම් ද ඇතුළුව ආණ්ඩුවේ පාලනමය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැලසීම ද, නැතහොත් පිළිවෙළින් රේගු, ආගමන සහ සෞඛ්‍ය විෂයයන් භාර අමාත්‍යවරයන් ගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන අවස්ථාවක, රේගු, ආගමන සහ සෞඛ්‍ය පිළිබඳ පාලනමය බලතල අධිකාරිය විසින් ම ක්‍රියාත්මක කිරීම ද;

(බ) ආණ්ඩුවේ පාලනමය කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා යෙදී සිටින සියලු තැනැත්තන් සඳහා ඉඩපහසුකම් සැලසීම ද;

(ම) ප්‍රමාණවත් සහ කාර්යක්ෂම ගිනි නිවීමේ සහ ආරක්ෂක උප කරණ ද සේවක පිරිස් ද සැපයීම සහ සියලු ගිනි අවි සහ ආරක්ෂක උපකරණ සම්බන්ධයෙන් නිතිපතා අභ්‍යාස හා ක්‍රියා කරවීම් සහ වෙනත් පිරික්සුම් කරගෙන යාම ද;

(ය) නියමිත ගාස්තු, කුලී සහ බදු එකතු කිරීම ද

කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ), (න), (ප) සහ (ම) ඡේදවල දක්වා ඇති බලතල හා කර්තව්‍ය අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධානවලට අනුකූලවම අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු අතර එහි බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම අමාත්‍යවරයාගේ පාලනය යටතේ කළ යුතු ය.

අනතුරක් සිදු වූ විට අධිකාරිය සතු කාර්යය.

20. ගුවන් යානයකට අනතුරක් හෝ ගුවන් තරණ ආධාරක වලට බාධාවක් හෝ හානියක් සිදු වූ විට අධිකාරිය විසින් ඒ කාරණය සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඔහුගේ උපදෙස් මත පමණක් ක්‍රියා කළ යුතු ය. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා විසින් දෙනු ලබන ලිඛිත උපදෙස් මත හැර, හානියට පත් ගුවන් යානය ඉවත් කිරීමට හෝ ඒ ගුවන් යානය හෝ ගුවන් තරණ ආධාරක අලුත්වැඩියා කිරීමට හෝ අධිකාරිය විසින් කිසිම උත්සාහයක් දරනු නොලැබිය යුතු ය.

අධිකාරියේ බලතල.

21. (1) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින්—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හා දැරීම ද අධිකාරිය විසින් අත්කර ගනු ලැබූ හෝ දරනු ලැබූ යම් චංචල හෝ නිශ්චල දේපළක් බැහැර කිරීම ද කළ හැකි ය. එසේ වුවද අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය නොමැතිව එවැනි කිසි ම නිශ්චල දේපළක් එසේ බැහැර කරනු නො ලැබිය යුතු ය;

(ආ) ගුවන් යානාවල ආරක්ෂාව සහ ගුවන් තරණ පහසුකම් කෙරෙහි නිසි සැලකිල්ල ඇතිව ස්වකීය බල ප්‍රදේශය ඇතුළත වූ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අනුමත කිරීම, ඊට කැමැත්ත දීම හෝ එය තහනම් කිරීම කළ හැකි ය. තව ද, ඉහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගෙන අධිකාරිය විසින් ස්වකීය බල ප්‍රදේශය ඇතුළත වූ යම් ගොඩනැගිල්ලක් කඩා දැමීමට හෝ සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ නියම කරනු ලැබිය හැකි අතර, ඒ නියමය පිළිබඳ ලිඛිත දැන්වීමක් ඒ ගොඩනැගිල්ලෙහි අයිතිකරුට හෝ පදිංචිකරුට දෙනු ලැබීමෙන් පසු දින විසි එකක කාලයක් තුළ ඒ නියමය අනුව ක්‍රියා කර නොමැති අවස්ථාවක, අධිකාරිය විසින් ඒ ගොඩනැගිල්ල කඩා දැමීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ කළ හැකි ය;

(ඇ) ගුවන් තරණ පහසුකම්වලට හෝ ස්වකීය බලය යටතේ ඇති යම් ගුවන් තොටුපොළක් පාවිච්චි කරන ගුවන් යානාවකට හෝ උපද්‍රවයක් වන්නේ යයි අධිකාරියේ මතය වන්නා වූ යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක හෝ ඇති යම් පහනක් හෝ ආලෝකයක් පාවිච්චි කිරීම අනුමත කිරීම හෝ ඒ සඳහා කැමැත්ත දීම හෝ එය තහනම් කිරීම කරනු ලැබිය හැකි ය. පවත්නා යම් පහන් හෝ ආලෝක කිරීම් ඉවත් කරන ලෙස හෝ සුළු වශයෙන් වෙනස් කරන ලෙස අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි ය. තවද එසේ ඉවත් කරනු නොලැබූ හෝ සුළු වශයෙන් වෙනස් කරනු නොලැබූ යම් පහනක් හෝ ආලෝක කිරීමක් ඉවත් කිරීම හෝ ඉවත් කිරීමට සැලැස්වීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය; එසේ වුව ද ඒ නියමය පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට අධිකාරිය විසින් දෙනු ලැබ, ඒ දැන්වීමෙන් පසු දින හතක කාලයක් තුළ ඒ නියමය අනුව ක්‍රියා කර නොතිබිය යුතු ය;

(ඈ) ගුවන් තරණ ආධාරක හා පහසුකම් සහ පණිවුඩ හුවමාරු කිරීමේ ක්‍රම සම්බන්ධයෙන් ඇතිවන නීත්‍යනුකූල නොවන බාධා වැළැක්වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය හැකි ය;

(ඉ) යම් සුන්බුන් මුක්තාවශේෂ කිරීම පිණිස යම් සේවයක් ඉල්ලා සිටින තැනැත්තකුගේ වියදමින් ඒ සුන්බුන් මුක්තාවශේෂ කිරීම පිණිස ද ඉල්ලා සිටිනු ලැබුව ද නො ලැබුව ද යම් අනතුරකින් පසු, ස්වකීය ගුවන් තොටු පොළෙන් යම් ගුවන් යානයක්, වාහනයක්, බඩු හෝ තැනැත්තන් හෝ ඉවත් කිරීම පිණිස ද අධිකාරියෙන් අවශ්‍ය විය හැකි යම් සේවා සලසනු ලැබිය හැකි ය; එසේ වුව ද නියමිත අනුප්‍රමාණ අනුව ඒ සේවා සඳහා ගාස්තුවක් අය කිරීමට අධිකාරියට හිමිකම් තිබිය යුතු ය. මෙහි විස්තර කරනු ලැබූ බලතල සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා විමසා හැර, ක්‍රියාත්මක කරනු නො ලැබිය යුතු ය.

(ඊ) අධිකාරියේ යම් දේපළකට සිදු වූ යම් අලාභහානියක් ප්‍රති පූරණය කිරීම සඳහා හෝ ඉහතින් වූ ඡේදය ප්‍රකාර සුන් බුන් කිසිවක හෝ ගුවන් යානයක හෝ වාහනයක හෝ කවර හෝ විස්තරයකට අයත් බඩුවල හෝ සතකුගේ, පැලැටියක නැතහොත් විකිණිය හැකි යම් දෙයක අයිති කරුගෙන් ලැබිය යුතු මුදලක් අය කර ගැනීම පිණිස ඒ සුන්බුන් හෝ ගුවන් යානය හෝ වාහනය හෝ කවර හෝ විස්තරයකට අයත් බඩු හෝ සතා හෝ පැලැටිය නැත හොත් විකිණිය හැකි දෙය ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ පෞද්ගලික වැඩ පිළිවෙලක් අනුව විකිණීම, ඒ විකිණීම සම්බන්ධයෙන් වූ යම් විධි සහ නියෝග අනුව ක්‍රියා කරමින් කළ හැකි ය.

(උ) ස්වකීය නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියම හා සේවා කොන්දේසි නිශ්චය කිරීම කළ හැකි ය ;

(ඌ) ගුවන් තොටුපොළවල සාමය හා ආරක්ෂාව පවත්වා ගෙන යාම පිණිස සේවක පිරිස් පත් කිරීම කළ හැකි ය ;

(එ) සුදුසු යයි අධිකාරිය කල්පනා කරන, අධිකාරියේ කර්තව්‍ය හා සම්බන්ධ සියලු මූල්‍ය, වාණිජමය, වෙළෙඳ සහ වෙනත් මෙහෙයුම් කටයුතු කරගෙන යාම කළ හැකි ය ;

(ඒ) අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තන් පුහුණු කළ හැකි ය ;

(ඔ) ස්වකීය කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු ගොඩනැගිලි ඉදිකිරීම සහ උපකරණ ලබා ගැනීම කළ හැකි ය ;

(ඕ) අධිකාරියේ සියලු ගොඩනැගිලි සහ උපකරණ අලුත්වැඩියා කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා විධිවිධාන සැලැස් විය හැකි ය ;

(ක) ජාත්‍යන්තර තත්ත්වයන්ට අනුකූල වන පරිදි ස්වකීය ගුවන් තොටුපොළවල් පවත්වා ගෙන යාම කළ හැකි ය ;

(ග) අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම සහ සුභ සාධක හා විනෝද පහසුකම් සැලසීම කළ හැකි ය ;

(ච) ගුවන් තොටුපොළ ඇතුළත තම කාර්ය ඉටු කිරීමෙහි යෙදී සිටින ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල, සංස්ථාවල හෝ ආයතනවල කාර්ය මණ්ඩල සඳහා සුභ සාධක හා විනෝද පහසුකම් සැලසීම කළ හැකි ය ;

(ජ) කටයුතු කාර්යක්ෂම ලෙස කිරීම සඳහා පැවරීම අවශ්‍ය යයි අධිකාරිය සලකන අධිකාරියේ යම් කර්තව්‍යයක් අධිකාරි යේ යම් නිලධරයකුට පැවරිය හැකි ය ;

(ට) අධිකාරියේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට එළඹීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම කළ හැකි ය ;

(ඩ) (i) ස්වකීය නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, උසස් කිරීමට, මාරු කිරීමට, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීමට, ඔවුන්ගේ විනය පාලනයට, හැසිරීමට සහ නිවාඩු දීමට ;

(ii) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමට

අදාළව රීති සෑදිය හැකි ය ;

(ණ) අධිකාරියේ අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ නැතහොත් ඊට ආනුෂංගික වන්නා වූ කිසියම් දෙයක් කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති බලතල හෝ කර්තව්‍ය, අමාත්‍යවරයා විමසීමෙන් පමණක්, අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

22. අධිකාරිය විසින්— අධිකාරිය විසින් ගාස්තු හෝ කුලී අයකළ හැකි බව.

(1) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව—

(අ) ගුවන් යානා ගොඩබෑම, පාවිච්චි කිරීම හෝ නවතා තැබීම සඳහා හෝ තම භාරයේ ඇති යම් ගුවන් තොටුපොළක් හෝ හෙලිකොප්ටර් තොටුපොළක් විසින් ගුවන් යානා මෙහෙයුම් සම්බන්ධයෙන් සලසනු ලබන වෙනත් යම් සේවයක් හෝ පහසුකමක් සඳහා ;

(ආ) අධිකාරිය විසින් යම් ගුවන් තොටුපොළක හෝ හෙලිකොප්ටර් තොටුපොළක සලසා ඇති පහසුකම් සහ වෙනත් සේවා, තැනැත්තන් විසින් පාවිච්චි කිරීම සහ භුක්ති විඳීම සඳහා

ගාස්තු හෝ කුලී අය කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කලින් කල, අධිකාරියට දෙනු ලබන උපදෙස් කෙරෙහි සැලකිලිමත්ව යම් ගුවන් තොටුපොළක හෝ හෙලිකොප්ටර් තොටුපොළක යම් කටයුත්තක් කරගෙන යාම සඳහා යම් පහසුකමක් සලසනු ලැබූ තැනැත්තන්ගෙන්, ගාස්තු හෝ කුලී අයකරනු ලැබිය හැකි ය.

23. යම් සේවයක් සලසනු ලැබුවේ යම් ගුවන් යානයක්, වාහනයක් හෝ දේපළක් සම්බන්ධයෙන් ද, ඒ ගුවන් යානය, වාහනය හෝ දේපළ සම්බන්ධයෙන් අධිකාරියට කැප අයිතියක් තිබිය යුතු ය. අධිකාරියට කැප අයිතියක් ඇති බව.

24. (1) අධිකාරිය සතු හෝ අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන යම් ගගන යාත්‍රාංගනයක් සම්බන්ධයෙන්, ඒ ගගන යාත්‍රාංගනය පාවිච්චි කිරීම හෝ ක්‍රියා කරවීම සහ ගගන යාත්‍රාංගනය ඇතුළත වූ සියලු තැනැත්තන්ගේ හැසිරීම විධිමත් කිරීම සඳහා සහ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමට අදාළ එවැනි වෙනත් කාරණා සඳහා අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි අතර විශේෂයෙන් ම— රීති.

(අ) ගගන යාත්‍රාංගනය පාවිච්චි කරන ගුවන් යානාවල, වාහනවල සහ තැනැත්තන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සහ ගගන යාත්‍රාංගනය පාවිච්චි කිරීම සහ ක්‍රියා කරවීම නිසා මහජනතාවට ඇතිවන අනතුරු වැළැක්වීම සඳහා ද;

(ආ) ගගන යාත්‍රාංගනයෙහි ආරක්ෂාව පවත්වා ගෙන යාම සඳහා ද ;

(ඇ) අධිකාරිය සතු හෝ අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන යම් ගගන යාත්‍රාංගනයක සේවයෙහි නියුක්ත තැනැත්තන් විසින් සොරකම් කිරීම වැළැක්වීම සඳහා ද;

(ඈ) අධිකාරිය සතු හෝ අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන යම් ගගන යාත්‍රාංගනයක ගුවන් බඩු ගබඩා කිරීම නැතහොත් පැටවීම හෝ බෑම සඳහා සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් පාවිච්චි කළ යුතු බවට අධිකාරිය විසින් නම් කරන ලද ප්‍රදේශවලින් ගුවන් බඩු සොරකම් කිරීම වැළැක්වීම සඳහා ද ;

(ඉ) ගගන යාත්‍රාංගනය ඇතුළත බාධා ඇතිවීම වැළැක්වීම සඳහා ද ;

(ඊ) ගගන යාත්‍රාංගනය ඇතුළත කවර හෝ ස්ථානයක රිය ගමනා ගමනය විධිමත් කිරීම සඳහා සහ විශේෂයෙන් ම, එහි වාහන පිළිබඳ වේග සීමා නියම කිරීම සඳහා සහ වාහන නවතා තැබීම හෝ රීතිවල සඳහන් යම් කාර්යයක් සඳහා හෝ යම් ආකාරයකින් හෝ ඒ වාහන පාවිච්චි කිරීම පරිසීමා කිරීම සඳහා නැතහොත් විධිමත් කිරීම සඳහා ද ;

(උ) අධිකාරිය විසින් නියම කරනු ලබන ස්ථානවල හැර, වාහන සහ රිය පෙට්ටි නවතා තැබීම තහනම් කිරීම සඳහා ද;

(ඌ) ගගන යාත්‍රාංගනයෙහි යම් කොටසකට ප්‍රවේශ වීම තහනම් කිරීම හෝ පරිසීමා කිරීම සඳහා ද ;

(එ) ගගන යාත්‍රාංගනය ඇතුළත සාමය ආරක්ෂා කිරීම සහ එහි වූ දේපළවලට අලාභ හානි සිදුවීම වැළැක්වීම සඳහා ද ;

(ඒ) ගගන යාත්‍රාංගනය ඇතුළත ප්‍රචාරණය කිරීම විධිමත් කිරීම සඳහා නැතහොත් පරිසීමා කිරීම සඳහා ද ;

(ඔ) ගගන යාත්‍රාංගනයෙන් හෝ එහි යම් විශේෂ කොටසකින් හෝ ඉවත්ව යන ලෙස බලයලත් තැනැත්තකු විසින් යම් තැනැත්තකුගෙන් ඉල්ලා සිටිනු ලැබුවහොත් එසේ ඉවත්ව යන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම සඳහා ද ;

(ඕ) රීතිවල කාර්යය සඳහා ගගන යාත්‍රාංගනය සංයුක්ත වත්තා වූ ප්‍රදේශය වශයෙන් ගනු ලබන ප්‍රදේශය පරිසීමා කිරීම සඳහා ද ;

(ක) ගුවන් තොටුපොළට පැමිණෙන හෝ ඉන් පිටත්ව යන ගුවන් යානාවලින් සෞඛ්‍යයට ඇතිවන අන්තරායන් වැළැක්වීමේ කාර්යය සඳහා ද ;

(ග) නැතිවූ දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ද

අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් සාදනු ලැබූ කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

## IV වන කොටස

## මුදල් කටයුතු

**25.** මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු හැකි ඉක්මණින් සහ ඉන් පසු කලින් කල, අමාත්‍යවරයා විමසා මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණ හා එසේ නිශ්චය කරනු ලබන නියම මත, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයෙන්, ඒකාබද්ධ අරමුදලෙන් අධිකාරියට ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

*ඒකාබද්ධ අරමුදලෙන් අධිකාරියට කරනු ලබන ප්‍රදාන.*

**26.** (1) අධිකාරියට අධිකාරියේ ම අරමුදලක් තිබිය යුතු අතර එය අධිකාරිය විසින් ම පවත්වා ගෙන යා යුතු ය.

*අධිකාරියේ අරමුදල.*

(2) (අ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පරිදි, අධිකාරියට ලැබෙන වාර්ෂික ගුවන් නැව් නැගීමේ බදු ;

(ආ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි දී හා කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමෙහි දී අධිකාරියට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) කවර හෝ ප්‍රභවයකින් ලැබෙන සියලු පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන

අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සහ කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීමෙහි ලා අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් පියවීම පිණිස අවශ්‍ය සියලු මුදල් ද ඒ අරමුදලින් ගෙවන ලෙස මේ පනත යටතේ හෝ මේ පනතින් නියම කර ඇති සියලු මුදල් ද අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**27.** අධිකාරියේ බැඳීම් ඉටු කිරීම සඳහා හෝ, මේ පනත යටතේ වූ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා හෝ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ අධිකාරියට අවශ්‍ය විය හැකි මුදල්, අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතය ඇතිව හෝ ඔහු විසින් දෙන ලද යම් සාමාන්‍ය බලයක නියමයන්ට අනුකූලව හෝ අයිරා අණකර මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් අධිකාරිය විසින් ණයට ගැනීම හෝ ණය කොන්දේසි මත ලබා ගැනීම හෝ කළ හැකි ය :

*අධිකාරිය සතු ණයට ගැනීමේ බලතල.*

එසේ වුව ද මේ වගන්තිය යටතේ අධිකාරිය විසින් ලබාගන්නා ලද ණය කිසිවක් වෙනුවෙන් ගෙවීමට තිබිය හැකි හිඟ මුදල්වල මුළු එකතුව කවර හෝ විටක, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

**28.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අධිකාරියේ මුදල් පාලනය හා ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

*1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.*

**29.** අධිකාරියේ මුදල් වර්ෂය එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයෙන් ආරම්භ වන මාස දොළහේ කාලපරිච්ඡේදය විය යුතු ය.

*අධිකාරියේ මුදල් වර්ෂය.*

## V වන කොටස

### කාර්ය මණ්ඩලය

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

30. අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන නිලධරයන් හා සේවකයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

නියමිත දිනයට පෙර සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ඇතැම් රජයේ නිලධරයන් විසින් කළ යුතු දැනුම් දීම.

31. (1) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවෙහි සේවයෙහි නියුක්තව සිටියා වූ ද, ස්වකීය ධුරයේ කර්තව්‍ය අධිකාරිය වෙත සතු කර ඇති හෝ අධිකාරිය විසින් පවරා ගෙන ඇත්තා වූ ද ආණ්ඩුවේ ස්ථාන මාරු සහිත සේවයක යම් රජයේ නිලධරයකු නොවන සෑම රජයේ නිලධරයකු සම්බන්ධයෙන් ම මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ ද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් විය යුතු යයි ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් දරන්නා වූ ද සෑම රජයේ නිලධරයකු විසින් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ වගන්තියෙහි හා 32 වන වගන්තියෙහි මින් මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයකට සති දෙකකට නොඅඩු කාලයකට පෙර තමා ඒ දිනයෙහි—

(අ) රජයේ සේවයෙන් ඉවත් වී 32(1) වන වගන්තිය ප්‍රකාර අධිකාරිය යටතේ සේවානියුක්තයකු වීමට ; හෝ

(ආ) රජයේ සේවයෙන් විශ්‍රාම ගෙන, 32(2) වන වගන්තිය ප්‍රකාර අධිකාරියේ සේවානියුක්තයකු වීමට ; හෝ

(ඇ) රජයේ සේවයෙන් විශ්‍රාම ගෙන අධිකාරිය යටතේ සේවා නියුක්තිය ලබා නොගැනීමට ; හෝ

අදහස් කරන බව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් රජයේ නිලධරයකු විසින් අදාළ දිනයට පෙර ඒ උපවගන්තිය යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා වෙත කරන ලද දැනුම් දීමක් අවසානාත්මක විය යුතු ය.

(4) (2) වන උපවගන්තියෙහි (අ) හෝ (ආ) ඡේදය යටතේ දෙන ලද සෑම දැනුම් දීමක් ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා විසින් අධිකාරිය වෙත යොමු කරනු ලැබිය යුතු ය. එවැනි යම් දැනුම් දීමක් පිළිගැනීම සම්පූර්ණයෙන් ම අධිකාරියේ අභිමතය පරිදි විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් එහි තීරණය අවසානාත්මක විය යුතු ය.

**31 (2) වන වගන්තියේ (අ) සිට (ඈ) දක්වා වූ ඡේද අනුව යම් ඡේදයක් යටතේ වූ දැනුම් දීමක බලපෑම.**

32. (1) අදාළ දිනයට පෙර 31 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි (අ) ඡේදය යටතේ දැනුම් දීමක් කරනු ලබන්නා වූ ද ඒ දැනුම් දීම අධිකාරිය විසින් පිළිගනු ලැබුවා වූ ද 31 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් යම් රජයේ නිලධරයකුට ඒ දිනයෙහි සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය යටතේ සේවා නියුක්තිය දෙනු ලැබිය යුතු අතර ඒ රජයේ නිලධරයා —

(අ) අධිකාරිය යටතේ වූ තම සේවා නියුක්ති කාලය තුළ අධිකාරියේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය ;

(ආ) අදාළ දිනයට ඉහතින් ම, සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව යටතේ වූ තම සේවා නියුක්ති කාලය තුළ ඔහු හිමිකම් ලැබූ පාරිශ්‍රමික, නිවාඩු, නිවාඩු දුම්රිය බලපත්‍ර සහ වෙනත් සේවා කොන්දේසි හා සම්බන්ධ සේවා නියම හා කොන්දේසිවලට, වඩා අඩු වාසිසහගත නොවන සේවා නියම හා කොන්දේසිවලට, (අ) ඡේදයට යටත්ව, හිමිකම් ලැබිය යුතු ය ;

(ඇ) ඔහු අධිකාරියේ සේවයෙහි නියුක්තව සිටින තාක් කල් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ප්‍රකාශ කරනු ලැබූ රජයේ සේවයේ තනතුරක් තවදුරටත් දරන ලෙස විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, අධිකාරිය යටතේ වූ ඔහුගේ සේවය ආණ්ඩුව යටතේ වූ සේවයක් වූවාක් මෙන් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ප්‍රදානය කරනු ලැබීම සඳහා ඔහු සුදුසු විය යුතු ය. තවද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් එකී ව්‍යවස්ථාවේ නියමවලට අනුකූලව විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය ප්‍රදානය කරනු ලැබිය හැකි ය ;

(ඈ) අධිකාරියේ සේවයේ නියුක්තව සිටි සෑම සම්පූර්ණ මාසයක් සඳහා, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි අධිකාරියෙහි සේවයෙහි ඔහු විසින් දරන ලද තනතුරෙහි ඔහුට ලැබුණු වේතනයේ යම් මුදලක් අධිකාරියේ අරමුදල්වලින් අධිකාරිය විසින් ඒ නැණත්තා වෙනුවෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබීම සඳහා ගෙවනු ලැබිය යුතු ය ;

(ඉ) අධිකාරියේ සේවයෙහි නියුක්තව සිටින තාක් කල්, වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද, ඒ ආඥාපනතේ අර්ථානුකූලව සහ එකී විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා ඔහු රජයේ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ඊ) අධිකාරිය යටතේ වූ තම සේවා නියුක්තියෙහි කාලය තුළ කවර හෝ විටක, මෙහි වූ (2) වන උපවගන්තියේ නියම ප්‍රකාර අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබීමට මනාපය පළ කරනු ලැබිය හැකි අතර, ඒ මනාපය ක්‍රියාත්මක කරනු ලැබූ විට—

(i) මේ වගන්තිය අනුව අධිකාරියේ කාර්ය මණ්ඩලයට ඔහු පත් කරනු ලැබූ දිනය වන විට රෝගාතුර වීමේ හේතුව මත රජයේ සේවයෙන් ඔහු විශ්‍රාම ගන්වනු ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු යම් ප්‍රදානයකට ඔහු සුදුසුකම් ලැබිය යුතු ය. තව ද වයස් ගතවීම, රෝගාතුර වීම හේතුකොට ගෙන හෝ ඒ කාර්ය මණ්ඩලයෙහි ඔහු විසින් දරන ලද ධුරය අහෝසි කරනු ලැබීමෙන් හෝ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් මත විශ්‍රාම ගන්වනු ලැබීමෙන් හෝ අධිකාරියේ කාර්ය මණ්ඩලයෙහි ඔහුගේ සේවා නියුක්තිය අවසන් කරනු ලැබුවේ නම් මිස, ඒ ව්‍යවස්ථා යටතේ කරනු ලැබූ එවැනි යම් ප්‍රදානයක මුදල ඔහුට ගෙවනු නොලැබිය යුතු ය; තව ද

(ii) මේ වගන්තියේ විධිවිධාන අනුව අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබීමෙන් පසු ඔහුගේ මරණය සිදු වූ විටක, අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබීමට ඉහතින් ම, ඔහු මිය ගියේ නම් ඒ ව්‍යවස්ථා යටතේ ඔහු සම්බන්ධයෙන් කරනු ලැබිය හැකි වූ ප්‍රදානයක් ඔහු සම්බන්ධයෙන් කරනු ලැබිය හැකි ය.

(2) 31 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් වන්නා වූ ද ඒ වගන්තියේ (ආ) ඡේදය යටතේ වූ දැන්වීමක් අදාළ දිනයට පෙර දෙනු ලබන්නා වූ ද යම් රජයේ නිලධරයකු—

(අ) අදාළ දිනයෙහි රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) ඒ නිලධරයා සහ අධිකාරිය විසින් එකඟවනු ලබන නියම හා කොන්දේසි මත අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද ඒ නියම හා කොන්දේසි, අදාළ දිනයට ඉහතින් ම ඒ නිලධරයා සේවයෙහි නියුක්ත කරනු ලැබූ නියම හා කොන්දේසිවලට වඩා අඩු වාසිසහගත නොවිය යුතු ය;

(ඇ) ඒ දිනයේ දී ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු යම් විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂිකයකට ඔහු සුදුසුකම් ලැබිය යුතු ය;

(ඈ) ඔහු විශ්‍රාම වැටුපකට සුදුසු වන්නේ නම් සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 2අ (1) (i) වන වගන්තිය යටතේ මනාපය පාවිච්චි නොකරන්නේ නම් අධිකාරිය යටතේ වූ ඔහුගේ සේවා නියුක්ති කාලය තුළ ඔහුට විශ්‍රාම වැටුප් ගෙවනු නොලැබිය යුතු ය;

(ඉ) ඔහු විශ්‍රාම වැටුපකට සුදුසු වන්නේ නම් හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 2අ(1)(i) වන වගන්තියේ විධිවිධාන අනුව ඔහුගේ විශ්‍රාම වැටුපෙන් හතරෙන් එක් පංගුවක් අර්ධ වශයෙන් පරිවර්තනය කිරීමෙන් පාරිතෝෂිකයක් ගැනීමට තීරණය කරන්නේ නම්—

(i) ඒ පාරිතෝෂිකය ඔහුට ගෙවනු නොලැබිය යුතු නමුත් මේ පනත යටතේ පිහිටුවනු ලබන අධිකාරියේ අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට එය බැර කරනු ලැබිය යුතු ය;

(ii) එකී ව්‍යවස්ථා යටතේ ඔහුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපෙහි ඉතිරි හතරෙන් තුන් පංගුව අධිකාරිය විසින් ඔහු සේවයෙහි නියුක්ත කරනු ලබන කාලය තුළ ඔහුට ගෙවනු නොලැබිය යුතු ය;

(iii) එකී ව්‍යවස්ථාවේ 2අ(1)(ii) වන වගන්තියෙහි සඳහන් "ඔහුගේ විශ්‍රාම ගැනීමේ දින සිට අවුරුදු දහයක" කාලය ආගණනය කිරීමේ කාර්ය සඳහා අධිකාරිය යටතේ ඔහුගේ සේවා නියුක්තියේ අවසාන දිනයට පසුව එළඹෙන දිනය ඔහුගේ විශ්‍රාම ගැනීමේ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද

(ඊ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුපක් සඳහා නොව, පාරිතෝෂිකයක් සඳහා ඔහු සුදුසුකම් ලබන්නේ නම් ඒ පාරිතෝෂිකය ඔහුට ගෙවනු නොලැබිය යුතු නමුත් මේ පනත යටතේ පිහිටුවනු ලැබූ අධිකාරියේ අර්ථ සාධක අරමුදලක ඔහුගේ ගිණුමට එය බැර කරනු ලැබිය යුතු ය.

(3) අදාළ දිනයට පෙර 31 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය යටතේ දැනුම් දීමක් කරන ඒ උපවගන්තියේ සඳහන් යම් රජයේ නිලධරයකු ඒ දිනයෙහි රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දිනයේදී ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු යම් විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂිකයකට ඔහු සුදුසුකම් ලැබිය යුතු ය:

එසේ වුව ද නිශ්චිත සේවා කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීම පිණිස බැඳුම්කරයකට හෝ ගිවිසුමකට ඔහු බැඳී සිටී නම්, ඒ සේවා කාලයේ සම්පූර්ණ කරනු නොලැබූ කොටස වෙනුවෙන් ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලක් ගෙවන ලෙස නියම කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

(4) 31 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ කරන ලද දැනුම් දීමක් අධිකාරිය විසින් භාරගනු නොලැබුවේ යම් රජයේ නිලධරයකුගෙන් ද ඒ රජයේ නිලධරයා අදාළ දිනයෙහි රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දිනයේ දී ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු යම් විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂිකයකට ඔහු සුදුසුකම් ලැබිය යුතු ය.

31 වන වගන්තිය අදාළ වන නිලධරයන් නොවන වෙනත් රජයේ නිලධරයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

33. (1) අධිකාරියේ ඉල්ලීම අනුව, 31 වන වගන්තිය අදාළ වන රජයේ නිලධරයකු නොවන යම් රජයේ නිලධරයකු, ඒ නිලධරයා පත් කිරීමට තත්කාලයෙහි බලය ඇති තැනැත්තාගේ කැමැත්ත ඇතිව සහ එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 26 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන හැර, ඒ වගන්තියේ (3) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක ඒ පනතේ 26 වන වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන ඒ නිලධරයා කෙරෙහි හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මේ පනත යටතේ කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් ආරක්ෂා කිරීම.

34. අධිකාරියේ යම් සාමාජිකයකු හෝ මේ පනතේ කාර්ය සඳහා පත් කරනු ලැබූ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන් හා සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

35. අධිකාරියේ සියලු සාමාජිකයන් හා සේවා නියුක්තයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

36. අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

## VI වන කොටස

### විවිධ

37. නියමිත දිනයෙහි සිට හා ඉන් පසු—

අධිකාරිය වෙත දේපළ සහ අයිතිවාසිකම් හා බැඳීම් පැවරීම සහ ලිඛිත නීතිය සුළු වශයෙන් වෙනස් කිරීම.

(අ) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා විසින් කළමනාකරණය කරන ලද හා පාලනය කරන ලද රජයේ සියලු චංචල හා නිශ්චල දේපළ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි නියම කරනු ලැබිය යුතු දිනයක සිට අධිකාරිය සතු විය යුතු යයි අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ දේපළ අධිකාරිය සතු විය යුතු ය;

(ආ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍ය වරයා විසින් ප්‍රකාශ කරනු ලබන රජයේ හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයාගේ සියලු හිමිසුම්, අයිතිවාසි කම්, බැඳීම් හා වගකීම් අධිකාරියේ හිමිසුම්, අයිතිවාසිකම්, බැඳීම් හා වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ ඒ අධිකාරිය වෙත භාරදෙනු ලැබූ හෝ පවරනු ලැබූ නැතහොත් නියම කරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමට හා කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීමට අධිකාරියට හැකි කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ යම් ප්‍රමාණයක සියලු ලිඛිත නීති සුළු වශයෙන් වෙනස් කරනු ලැබ ඇතැයි සලකනු ලැබිය යුතු ය.

38. 37 වන වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් නියමයක් කර ඇති අවස්ථාවක, ප්‍රස්තුත ගුවන් තොටුපොළ විෂයෙහි යම් පාලනයක් හෝ බලයක් ක්‍රියාත්මක කරන ලෙස වෙනත් යම් අධිකාරියකට මේ පනතේ නියම ප්‍රකාර නිශ්චිතව බලය දී ඇත්නම් මිස, ඒ වෙනත් අධිකාරිය විසින් ඒ පාලනය හෝ බලය ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරන්නේ යයි කියනු ලැබීම කරනු නො ලැබිය යුතු ය.

අමාත්‍යවරයාගේ නියමයක බලපෑම.

39. (1) අධිකාරියේ කාර්ය අතුරින් යම් කාර්යයක් සඳහා රජයේ ඉඩම් නොවන යම් ඉඩමක් අවශ්‍ය වන්නා වූ හා යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ අවස්ථාවක ඉඩම් අත්කර ගැනීමේ පනත අදාළ කිරීමේ කාර්යය සඳහා අත්කර ගැනීමට අදහස් කරනු ලබන ඉඩම පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ඉඩම ඒ පනත යටතේ අත්කරගෙන අධිකාරිය වෙත පවරනු ලැබිය හැකි ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා ඉඩම් අත් කර ගැනීම.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය වෙනුවෙන් ඉඩම් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු ය.

40. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයාට සහ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්ට ස්වකීය කාර්ය ඉටුකිරීම සඳහා සියලු අවස්ථාවන්හි දී අධිකාරිය විසින් කළමනාකරණය කරනු හෝ පාලනය කරනු ලබන යම් ගුවන් තොටුපොළකට නිදහස් හා පරිසීමා නොකරන ලද ප්‍රවේශය සලසනු ලැබිය යුතු ය.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයාට ගුවන් තොටුපොළට ප්‍රවේශය සැලසිය යුතු බව.

නියෝග.

41. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධි විධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, නියෝග සෑදීමට මේ පනත යටතේ බලය දී ඇති හෝ නියමිත සියලු කාරණා සඳහා හෝ ඒ කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

රීති හා නියෝග පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු බව.

42. අධිකාරිය විසින් 24 වන වගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම සහ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම රීතියක් ම නැතහොත් සෑම නියෝගයක් ම, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු ලැබූ සෑම රීතියක් ම නැතහොත් සෑම නියෝගයක් ම, එය මෙහි ලා පනවනු ලැබුවාක් මෙන් වලංගු හා බලසහිත විය යුතු ය.

වැරදි හා දණ්ඩන.

43. මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ සාදනු ලැබූ යම් රීතියක් හෝ නියෝගයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය.

44. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ගගන යාත්‍රාංගනය" යන්නෙන්, ව්‍යෝම යානා, ග්ලයිඩර් සහ හෙලිකොප්ටර් යානා ඇතුළුව කවර හෝ විස්තරයකට අයත් ගුවන් යානාවල පැමිණීම, පිටත්වීම සහ ගුවන් යානා ඔබ මොබ යාම සඳහා පහසුකම් සැලසීම පිණිස වෙන් කොට පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් බිම් හෝ ජල ප්‍රදේශයක් අදහස් වේ ;

"ගුවන් යානය" යන්නෙන්, අහස්යාත්‍රා, ව්‍යෝම යානා, ග්ලයිඩර් සහ හෙලිකොප්ටර් යානා ඇතුළුව සියලු වර්ගවලට අයත් ගුවන් යානා අදහස් වේ;

"ගුවන් තරණ සේවා" යන්නෙන්, ගුවන් තරණ ආධාරක හා ගුවන් තරණ පහසුකම් අදහස් වන අතර ඒවා ඊට ඇතුළත් වේ;

"ගුවන් තොටුපොළ" යන්නෙන්, ගුවන් යානා ආවරණය, සේවා කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා සහ මගින් හෝ ගුවන් බඩු භාරගැනීම හෝ ගොඩබෑම සඳහා පහසුකම් සලසනු ලැබූ ගගන යාත්‍රාංගනයක් අදහස් වන අතර, හෙලිකොප්ටර් තොටුපොළක්ද ඊට ඇතුළත් වේ;

"ගුවන් ගමන් පාලනය" යන්නෙන්—

(අ) (i) ගුවන් යානා අතර, සහ

(ii) ගුවන් යානා සහ බාධක අතර හැසිරවීමේ ප්‍රදේශ මත

ගැටීම් වැළැක්වීමේ; සහ

(ආ) ක්‍රමවත් ගුවන් ගමන් ධාවනයක් ඉක්මන් කිරීමේ හා පවත්වාගෙන යාමේ

කාර්ය සඳහා සපයනු ලබන සේවයක් අදහස් වේ;

"ගොඩනැගිල්ල" යන්නෙන්, යම් ව්‍යුහයක් හෝ ඉදිකිරීමක් අදහස් වේ;

"හෙලිකොප්ටර් තොටුපොළ" යන්නෙන්, හෙලිකොප්ටර් යානා ගොඩ බැස්සවීම හා පිටත්වීම සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන පොළව මතුපිට වූ හෝ ව්‍යුහයක් මත ආරෝහණය කරනු ලැබූ ප්‍රදේශයක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ගුවන් සේවය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"ගුවන් තරණ ආධාරක" යන්නෙන්, ගුවන් මාර්ගයක් දිගේ වූ දෘශ්‍ය හා අදෘශ්‍ය ගුවන් තරණ ආධාරක, ගගන යාත්‍රාංගන වලට ළඟාවීම සහ ගොඩ බැස්සීම සඳහා වූ දෘශ්‍ය හා අදෘශ්‍ය ආධාරක, පණිවුඩ හුවමාරු සේවා, කාලගුණ විද්‍යාත්මක සේවා සහ ගුවන් ගමන් පාලන සේවා අදහස් වේ;

"ගුවන් තරණ පහසුකම්" යන්නෙන්, ගුවන් යානා ආරක්ෂා සහිතව ගුවන් තරණය කිරීම සඳහා අවසර දීමට සලසනු ලැබූ පහසුකම් අදහස් වන අතර, දෘශ්‍ය හා අදෘශ්‍ය ගුවන් තරණ ආධාරක ද ඊට ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නියමිත බව අදහස් වේ; තවද

"ජනරජය" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අදහස් වේ.